**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

## ජනතාවගේ සබ්මැරීනය - ඉන්දීය නාවික හමුදාවේ වාගීර් සබ්මැරීනය නැරඹීමට දහස් ගණනක් පැමිණෙති

2023 ජූනි 21 වන දින උදෑසන ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය 9 වන ජාත්‍යන්තර යෝගා දිනය සැමරීම සඳහා කොළඹ වරායේ දී යෝගා වැඩසටහනක් සංවිධානය කර තිබිණ. මෙම වැඩසටහන 2023 ජාත්‍යන්තර යෝගා දිනයේ සිදු කළ සුවිශේෂී කර්තව්‍යයක් වන ගෝලීය සාගර වළල්ල සමඟ කොළඹ එන් කරමින් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන ඉන්දීය නාවික හමුදාවේ වාගීර් සබ්මැරීනය මත සහ එය අසල සංවිධානය කර තිබිණ. යෝගා දිනය සමරමින් මෙම ගෝලීය සාගර වළල්ල නිර්මාණය කිරීම සඳහා ඉන්දීය නාවික හමුදා නෞකා 19ක් ලොව පුරා විවිධ රටවලට පිටත් කර හැර ඇත.

2. ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා සහ බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් පී. එස්. ද සිල්වා යන මහත්වරු ඇතුළු ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන්, INS වාගීර් කාර්ය මණ්ඩලය සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.

3. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෙදා හදා ගන්නා උරුමයක් වන යෝගා ව්‍යායාමවල පරිවර්තනීය බලය අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ යෝගා මධ්‍යස්ථාන සහ යෝගා ලෝලීන්ගේ මහත් සහයෝගය සහ උනන්දුව ඇතිව මහ කොමසාරිස් කාර්යාලය සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික

මධ්‍යස්ථානය පසුගිය දින 50 තුළ රට පුරා යෝගා වැඩසටහන් 100කට ආසන්න සංඛ්‍යාවක් සංවිධානය කළ බව ද එතුමා සිහිපත් කළේය. 2023 ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකාවට පැමිණි INS වාගීර් සබ්මැරීනය සුහදත්වය, මිත්‍රත්වය සහ සහෝදරත්වය පිළිබඳ පණිවිඩය ශ්‍රී ලංකාවට රැගෙන ආ බව මහ කොමසාරිස්තුමා අවධාරණය කළේය.

4. ඉන්දියානු නාවික හමුදාවට අලුතින්ම එක් වූ කල්වරි පන්තියේ දේශීයව නිපදවන ලද INS වාගීර් සබ්මැරීනය විසින් විදේශ වරායක් වෙත සිදු කරන ලද ප්‍රථම සංචාරය මෙයයි. 2023 ජූනි 19-22 දිනවල සිදු කෙරෙන කොළඹ සංචාරය අතරතුර පාසල් දරුවන්, බාලදක්ෂයන් සහ බාලදක්ෂිකාවන්, ජාතික ශිෂ්‍ය භට බලකා සාමාජිකයන්, ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සබ්මැරීනය නැරඹීමට පැමිණි අතර එයට ගොඩවීමේ දුර්ලභ අවස්ථාව ද ඔවුන්ට හිමි විය. INS වාගීර් සබ්මැරීනයේ කාර්ය මණ්ඩලය කොළඹ පාසල් දරුවන් ද හමු වූ අතර පාසල් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ද තිළිණ කළේය. මෙම සංචාරය ඉන්දියාවේ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය සහ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන දැක්ම අනුව අසල්වැසි රාජ්‍යයන් දෙකෙහි නාවික හමුදාවන් අතර සහෝදරත්වය සහ එකමුතුභාවය ඉහළ නැංවීමට ඉවහල් විය.

***

කොළඹ
2023 ජූනි 22